www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරානය පිලිබඳව එක්සත් ජනපදය හා යුරෝපීය සංගමයේ ගනුදෙනුව: සාකච්ඡාමය විසඳුමකට නොව ගැටුමක් කරා පියනැගීමකි

## US-EU deal on Iran: a step towards confrontation, not a negotiated settlement

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2005 මාර්තු 25**

යුරෝපා සංගමය (යුසං) ඉරානය සමග ගෙනයන සාකච්ඡාවන් සමග ''සහයෝගීව කටයුතු කිරීමට''මෙම මස මුලදී බුෂ් පරිපාලනය ගත් තීරනයෙන් ඉරානයේ න්‍යෂ්ටික වැඩ සටහන පිලිබඳව එක්සත් ජනපදයේ ආකල්පයන් මෘදු වීම වෙනුවට සිදුවන්නේ සාකච්ඡා බිඳ වැටීමක් හා විවෘත ගැටුමක නැමියාව තීව්‍ර කිරීම පමනි.

යුරෝපා සංගමයට අයත් - ප්‍රන්සය, ජර්මනිය, හා බ්‍රිතාන්‍යය - හා ඉරානය අතර පැරිසියේ පැවති මෑත සාකච්ඡා වටය කිසිදු එකඟතාවකින් තොරව මෙම බදාදා බිඳ වැටුනි. සාකච්ඡාවල ප්‍රතිඵලය ධනාත්මක යයි පෙන්වීමට දැරුනු උත්සාහයන් තිබියේ වුව ද ගනු ලැබූ එකම නිශ්චිත තීරනය වූයේ සාකච්ඡා ඉදිරියට ගෙන යා යුතු බවයි. දින නියමයක් නොමැතිව සාකච්ඡාවන් ඇදී යාමට තමන් ඉඩ නො දෙන බව ඉරානය නිරන්තරයෙන් ප්‍රකාශ කොට ඇත.

සාකච්ඡාවල පදනම වූයේ පසුගිය නොවැම්බරයේ ඉරානය හා යුරෝපා සංගමයේ රටවල් තුන අතර අන්තර්ජාතික පරමානුක බල ශක්ති ඒජන්සියේ (අයිඒඊඒ) පාලක මන්ඩල රැස්වීමකට මඳකට පෙර අත්සන් තැබූ ගිවිසුමක සම්බාධක පැනවිය හැකි වන පරිදි ඉරානය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය වෙත යොමු කිරීමේ එක්සත් ජනපදයෙන් කෙරෙන බලපෑම් මධ්‍යයේ ඉරානය පරිපූර්න ආර්ථික, තාක්ෂනික හා ආරක්ෂක ගිවිසුමක් පිලිබඳව යුරෝපා සංගමය සමග කරන සාකච්ඡාවලට හිලවු වශයෙන් සියලුම යුරේනියම් ප්‍රවර්ධන හා ප්ලුටෝනියම් වියෝජන ක්‍රියා අත්හිටුවීමට එකඟ විය.

සාකච්ඡාවන්හි ප්‍රගතියක් දක්නට නො ලැබුන හොත් තම ප්‍රවර්ධන වැඩ සටහන යලි ආරම්භ කරනු ඇති බවට ඉරාන නියෝජිතයෝ එහිදී අනතුරු ඇඟවූහ. තම න්‍යෂ්ටික වැඩ සටහන න්‍යෂ්ටික බලශක්ති උත්පාදනය ඇතුලු සාමකාමී අරමුනු සඳහා බවත් න්‍යෂ්ටික අවි හරන ගිවිසුමට ( N P T ) තම කැපවීමත් යලි සහතික කරමින් ඔවුන් නිල ප්‍රකාශයක් නිකුත් කලහ.

යුරෝපීය බලවතුන්, තමන්ගේ පැත්තෙන්, ගිවිසුම යටතේ ඉරානය සතු අයිතිවාසිකම් පිලිගත්හ. න්‍යෂ්ටික ඉන්ධන චක්‍රයේ සෑම අංගයක්ම - යුරේනියම් ප්‍රවර්ධනය හා දවුනු ඉන්ධන ප්‍රතිචක්‍රීකරනය ද ඇතුලත් - ක්‍රියාත්මක කිරීමේ අයිතිය මීට ඇතුලත් වේ. කෙසේ වුවද සාකච්ඡාවල දී වොෂින්ටනයේ බලපෑම යටතේ යුරෝපීය සංගමයේ රටවල් තුන දැඩිව කියා සිටියේ පසුගිය නොවැම්බරයේ අත්සන් කල ගිවිසුමේ අඩංගු වෛෂයික සහතිකවීම ඉක්මවා යන ඉරානය යුරේනියම් ප්‍රවර්ධනයේ නිරතවීමට ඇති අයිතිය සම්පූර්නයෙන් අහිමි කර ගෙන ඇති බවයි. සාකච්ඡා ඇනහිට ඇත්තේ හරියට ම මෙහිදී ය .

මෙම සන්දර්භය තුල මාර්තු 11දා ඉරානය සමග පැවැත්වෙන සාකච්ඡා පිලිබඳව යුසං රටවල් තුන සමග බුෂ් පරිපාලනය ගිවිසුමකට එලඹියේ ය. එය බොහෝ දුරට දෙපැත්ත කැපෙන කඩුවකි: සාකච්ඡාවලට සහයෝගයක් වශයෙන් ටෙහෙරානයට අර්ථික සහන ලබාදීමට වොෂින්ටය ඉදිරිපත් වූ අතර සකච්ඡා පැවැත්වෙන අතරතුර ඉරානය තම යුරේනියම් ප්‍රවර්ධන කටයුතු යලි ඇරඹුව හොත් එක්සත් ජාතීන් වෙත ඉරාන ප්‍රශ්නය යොමු කිරීමට සහය දෙන බවට යුරෝපීයයෝ එකඟ වූහ.

යථාර්ථයේ දී එක්සත් ජනපදයට හිමිවන්නේ සොච්චමකි: ලෝක වෙලඳ සංවිධානයට එක් වීම සඳහා ඉරානය ඉදිරිපත් කල අයදුම් පත්‍රය කෙරෙහි වන දීර්ඝ කාලීන විරුද්ධත්වය අත්හැර දැමීමට හා මගී ගුවන් යානාවලට බෙහෙවින්ම අවශ්‍ය අමතර කොටස් විකිනීමට අවසර දීමේ පොරොන්දුවකි. ලෝක වෙලඳ සංවිධානයේ සාමාජිකත්වය සඳහා ඕනෑම අදියරක දී එක්සත් ජනපදයට අයදුම්පත ඉදිරිපත් කිරීම අවහිර කල හැකි දීර්ඝ ක්‍රියාවලියක ප්‍රථම පියවර පමනි. එක්සත් ජනපදයෙන් ඉරානයට කෙරෙන ඕනෑම අමතර කොටස් අලෙවියක් විශේෂයෙන්ම එකින් එක අධීක්ෂනය කිරීමේ පදනමක් මත සිදු කරනු ඇත.

එක්සත් ජනපදය සාකච්ඡාවලට සම්බන්ධ නොවනු ඇති බව රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් අවධාරනය

කලාය. ''යුරෝපීයයන්ට මූලෝපායක් ඇත. අපි එම රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලට සහාය දක්වන්නෙමු. එහෙත් මෙය යුරෝපීයයන්ගේ අත ශක්තිමත් කිරීමක් මිස ඉරානීයයන්ට ප්‍රතිලාභ දීමක් නො වේ.'' ඇය කීවා ය. වෙනත් වචනවලින් කිව හොත්, වොෂින්ටනය සැලකිලිමත්වන ප්‍රධාන කාරනය එක්සත් ජාතීන්ගේ සම්බාධකවල තර්ජනය මිස ඉරානයට ආර්ථික ''ප්‍රතිලාභ'' දීම නො වේ.

ටෙහෙරානය මත ආර්ථික මුරිච්චි තද කිරීමේ ලා වොෂින්ටනයේ අධිෂ්ඨානය මගින් එක්සත් ජනපදය - ඉරානයට පිරිනමා ඇති දෙයෙහි සංකේතාත්මක ස්වභාවය තවදුරටත් සනිටුහන් කරයි. ඉන්දියාවට හා පාකිස්තානයට රයිස් මෑතදී කල සංචාරයේ ප්‍රධාන අරමුනුවලින් එකක් වන්නේ ඉන්දියාවේ වර්ධනය වන බල ශක්ති ඉල්ලුම පිරිමැසීම සඳහා පකිස්ථානය හරහා ඉරාන ගෑස් ප්‍රවාහනය කිරීමට ඩොලර් බිලියන 4.2ක වියදමින් නල මාර්ගයක් ඉදි කිරීමේ සැලසුම් නවතා දැමීමට රටවල් දෙකට බල කිරීම යි. මෙම ව්‍යාපෘතිය අවලංගු කිරීම ඉරානයට මෙන්ම ඉන්දියාවට හා පකිස්තානයට ද දරුනු පහරක් වනු ඇත.

යුරෝපීය බලවතුන් දැන් බන්ධනයකට හසුව සිටියි. ඉරානය පිලිබඳ සාකච්ඡාවලදී වෙට්ටු දැමීමට යුරෝපීය සංගමයට ඇත්තේ සීමිත ඉඩ ප්‍රස්ථාවක් වන අතර එක්සත් ජනපදයේ රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීම්වලටත් මැරකම්වලටත් විශාල ඉඩක් සැලසී ඇත. සාකච්ඡා සම්පූර්නයෙන් බිඳ වැටුන හොත් වොෂින්ටනයට දැඩි පියවර ගැනීමට ඉඩ ලැබෙන පරිදි එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය වෙත ඉරානය ගෙන ඒමට යුරෝපීය සංගමය බැඳී සිටියි. මෙම තත්වය පිලිබඳව යුරෝපීය ආන්ඩු මනා අවබෝධයකින් සිටින නමුත් නැවත වතාවක් ඔවුහු ගැටුමක අවදානම දැරීම වෙනුවට වොෂින්ටනය සතුටු කිරීමේ මාවත තෝරා ගත්හ.

යුරෝපීය සංගමයේ මූලික වෙලඳ සහකරුවකු ද ප්‍රධාන තෙල් සැපයුම්කරුවකු ද වන බැවින් ඉරානය සමග කරන සාකච්ඡාවන්හි දී යුරෝපීය රටවලට බොහෝ දෑ පරදුවට තැබීමට සිදුව තිබේ. ඉරානයට එරෙහි ඕනෑම වෙලඳ සම්බාධකයක් හෝ මිලිටරි ක්‍රියා මාර්ගයක් යුරෝපයට අර්ථභාරී ආර්ථික ප්‍රතිවිපාක ගෙන එනු ඇති නමුත් දශක දෙකක් පුරා ඉරානයට ආර්ථික තහංචි දමාගෙන සිටින එක්සත් ජනපදයට සත්‍ය වසයෙන් ම එසේ නො වේ. අවසාන විග්‍රහයේ දී බුෂ් පරිපාලනයේ ආක්‍රමනශීලී ආස්ථානය යොමු වී ඇත්තේ ඉරානයට වඩා තම යුරෝපීය ප්‍රතිමල්ලවයන් වෙත වන අතර එමගින් මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ තෙල් බහුල කලාප මත එක්සත් ජනපදයේ ආර්ථික හා මූලෝපායික ආධිපත්‍යය තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

**එක්සත් ජනපදයේ අභූත පිරිනැමීම**

එක්සත් ජනපදයේ හා යුරෝපීය සංගමයේ සාකච්ඡාවෙහි අර්ථය පිබඳව ඉරානය තුල මිථ්‍යාවන් කිහිපයක් පැවතුනි. එක්සත් ජනපදයේ සහන පිදීම් ''පරිත්‍යාගයක් යයි කීම අභූතයක්'' බව ප්‍රකාශ කරන ඉරාන නියෝජිත සයිරස් නසේරි ඒවා ප්‍රතික්ෂේප කලේ ය. එය ''මීයෙක් සඳහා සිංහයෙකු හුවමාරු කිරීම හා සමාන'' යයි ඔහු සීඑන්එන් නාලිකාවට ප්‍රකාශ කලේ ය. වොෂින්ටනය සමග සබඳතා වෙනතකට හරවමින් පිස්ටැෂියෝ නම් ඇට වර්ගය පිරවූ රථ කිහිපයක් වෙනුවෙන් තමන්ගේ ම න්‍යෂ්ටික ඉන්ධන නිෂ්පාදනය අත් හැරීමට වොෂින්ටනය සූදානම් දැයි'' ඔහු කෝපයෙන් ප්‍රශ්න කලේ ය.

නසේරිගේ අදහස්වලින් කරුනු කිහිපයක් ඉස්මතු වෙයි. න්‍යෂ්ටික වැඩ සටහන ඉරානය තුල අතිශය සංවේදී දේශපාලනික මාතෘකාවකි. ඉරානය රහසේ න්‍යෂ්ටික අවි තනමින් සිටින බවට වොෂින්ටනය කරන චෝදනාවේ පැහැදිලි කුහකත්වය බොහෝ ඉරානීයන් කෝප ගන්වයි. ටෙහෙරානය තම න්‍යෂ්ටික වැඩ පිලිවෙල අවසන් කල යුතු යයි කියා සිටින බුෂ් පරිපාලනය මැදපෙරදිග තම ප්‍රධාන සගයා වන ඊශ්‍රායලය, න්‍යෂ්ටික අවි හරන ගිවිසුම (එන්පීටී) සම්පූර්නයෙන් ම නොතකා හරිමින් න්‍යෂ්ටික අවි ගොඩනැගීම නොදක්කාක් සේ අහක බලා සිටියි.

ඉරානය එක්සත් ජනපදයේ බලපෑම්වලට යට වුව හොත් එරට තුල ක්ෂනික දේශපාලනික අර්බුද ඇති කරනු ඇතැයි *ඒෂියා ටයිම්ස් වෙබ් අඩවියට* ලිපියක් සැපයූ කෙවන් අෆ්‍රාෂියාබි නම් විචාරකයා විස්තර කලේ ය. ''නිසැකවම ඉරානය තුල දැවැන්ත දේශපාලන ප්‍රතිප්‍රහාරයක් දියත් වනු ඇති අතර එවන් නින්දිත කේවලයක නිරත වූ ඉරාන නියෝජිත රෝහානි සහ අනෙකුත් අය ක්ෂනිකව දේශපාලනික දඩයමට ලක් වනු ද, න්‍යෂ්ටික අවි හරන ගිවිසුමෙන් ඉවත් වී න්‍යෂ්ටික වැඩ පිලිවෙල ගැන කිසිදු පිටස්තර නිරීක්ෂනයක් අවහිර කරන උතුරු කොරියාවේ මාවත අනුගමනය කරන දක්ෂ හා වඩාත් ආක්‍රමනකාරී දේශපාලඥයන් මගින් ඔවුන් විස්ථාපනය කරනු ද ඇත.''

ජූනි මාසයේ දී ඉරානයේ ජනාධිපතිවරනය පැවැත්වීමට නියමිතව ඇති තත්වය තුල ජාතිකවාදී මනෝගතිය අවුස්සාලීම සඳහා න්‍යෂ්ටික ප්‍රශ්නය නිමිත්තක් කර ගනු ඇති බව නිසැක ය. මේ සතියේ රූපවාහිනී වැඩසටහනක කතා කල ඉරාන කොන්සවේටිව් අධ්‍යාත්මික නායක අයතුල්ලා අලි කමේනි යුද්ධය සඳහා කුමක් හෝ නිමිත්තක් සොයමින් සිටින බවට එක්සත් ජනපදයට චෝදනා කරමින් මෙයට තානය දැමීය. ''මෙම ජාතිය අම්හිරි අත් දැකීමකින් පරීක්ෂා කරනු ලැබුව හොත්, මම යුද

ඇඳුමෙන් සැරසී ජාතියේ නායකත්වයෙහි සිටිමින් මගේ ජීවිතය කැපකිරීමට සූදානම්'' යයි ඔහු ප්‍රකාශ කලේ ය.

වොෂින්ටනයේ චෝදනා තිබියේ වුවද, ඉරානය න්‍යෂ්ටික අවි තැනීමට ඉලක්ක කරන බවට තීරනාත්මක සාක්ෂි නැත- මෙය තම නිරීක්ෂන මත පදනම්ව අන්තර්ජාතික පරමානුක බල ශක්ති ඒජන්සිය (අයිඊඊඒ) මගින් ද සනාථ කල කරුනකි. ඉරානයේ සමහර න්‍යෂ්ටික පහසුකම් පිලිබඳව දැනුම් දීමට අසමත් වීම ගැන අයිඊඊඒය එරට විවේචනය කොට ඇත. ඉරානය කිසිදු න්‍යෂ්ටික තාක්ෂනයකට ප්‍රවේශ වීම වැලැක්වීමට දශක දෙකක් පුරා එක්සත් ජනපදය දරන උත්සාහය හමුවේ එවැනි රහස්‍යභාවයක අර්ථය තේරුම් ගත හැක. බුෂෙර්හි ඉරාන න්‍යෂ්ටික බල ශක්ති ප්‍රතික්‍රියාකාරකය ගොඩනැංවීම සම්පූර්න කිරීමට රුසියාවට ලැබී ඇති කොන්ත්‍රාත්තුව අත හැර දමන ලෙස වොෂින්ටනය නිරන්තරයෙන් රුසියාවට බලපෑම් කර ඇත. ඇමරිකානු හිතවාදී ෂා මොහොමඩ් රීසා පාලෙවිගේ ආඥාදායක පාලන තන්ත්‍රය යටතේ එක්සත් ජනපදයේ දිරිගැන්වීම් සහිතව මෙම වැඩසටහන 1970 ගනන්වල ආරම්භ කරනු ලැබිනි.

බුෂ්ගේ ප්‍රතිපත්තිය පිලිබඳව එක්සත් ජනපද පාලක කවයන් තුල ඇති කනස්සල්ල පිලිබිඹු කරමින්, එක්සත් ජනපදයේ පලවන *ෆොරීන් එෆෙයාස්* සඟරාවේ මෑතම කලාපයක පලවූ ලිපියක්, න්‍යෂ්ටික අවි ගබඩා කර ගැනීමට ඉරානයට යම් සාධාරනීකරනයක් තිබුනු බව පිලිගත්තේ ය.

''සියල්ලට පසුව, මිලිටරි පූර්වභංගය පිලිබඳ තම ප්‍රකෝපකාරී ධර්මය ක්‍රියාවට නැගීමට වොෂින්ටනයේ ඇති කැමැත්ත සනාථ කර ඇති අතර න්‍යෂ්ටික අවි සඳහා ඉරානයේ යොමුවීම ඒසඳහා මූලෝපායික අර්ථයක් සම්පාදනය කරයි. ඒවා අත් කර ගැනීමට වේගයෙන් ගමන් කිරීම ගැන ටෙහෙරානය ට සම්පූර්නයෙන් දොස් පැවරිය නොහැක. බුෂ් පරිපාලනය විසින් තවමත් න්‍යෂ්ටිකකරනය වී නොතිබුනු ඉරාකය ආක්‍රමනය කර ඒවන විටත් න්‍යෂ්ටිකකරනය වී තිබුනු උතුරු කොරියාවට එරෙහිව බලය යෙදීමෙන් වැලකී සිටීම මගින් ඉරානීයයන් ඒත්තු ගෙන ඇත්තේ එක්සත් ජනපද මිලිටරි ආක්‍රමනයක් වැලැක්විය හැකි එකම ප්‍රායෝගික සාධකය න්‍යෂ්ටික අවි බව'' යයි එය සඳහන් කලා ය.

## ඇමරිකාවේ න්‍යෂ්ටික අවි ගබඩාව

වොෂින්ටනයට එහි න්‍යෂ්ටික ඉන්ධන ගබඩාවට හිලවු ලෙස ''පිස්ටැෂියෝ ඇට තොගයක්'' දීමට ඉරාන නියෝජිත නසේරි කරන යෝජනාව පුරසාරම් දෙඩීමක් ලෙස නොතකා හල හැකි ය. එහෙත් එය ජාත්‍යන්තර මාධ්‍ය තුල සම්පූර්නයෙන්ම නොතකා හැර ඇති වෙනත් කරුනක් ඉස්මතු කරයි.

න්‍යෂ්ටික හරන ගිවිසුම 1970 දී බල ගැන්වුනු විට එය ද්වී-පාර්ශ්වික පලහිලව්වක් විය. න්‍යෂ්ටික අවි අයත්ව නොතිබුනු රටවල් එහි සංවර්ධනය හැකිතාක් දුරට සාමකාමී කටයුතු සඳහා න්‍යෂ්ටික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ය යන ව්‍යාජ දිවුරුමකට එකඟ වූහ. අනෙක් අතට එක්සත් ජනපදය ද ඇතුලත් ''න්‍යෂ්ටික සමාජයේ'' කොටස්කාරයන් තම න්‍යෂ්ටික අවි තොග ප්‍රගතිශීලී ලෙස විනාශ කර දමන බවට එකඟ වූහ.

බුෂ් පරිපාලනය, ඉරානය හා උතුරු කොරියාව වැනි රටවල් මත කරන අතිශය වරනීය හා ආක්‍රමනශීලී ඉල්ලීම තුල සිය නීතිමය වගකීම හෝ තමන්ගේ ම යෝධ න්‍යෂ්ටික අවි තොගය ඉවත් කිරීම හිතාමතා ම නොතකා හරී. *සිඩ්නි මෝර්නිං හෙරල්ඩ්* පුවත්පතට මෑත දී ලිපියක් ලියූ හිටපු ඉරාන ප්‍රධාන අවි නිරීක්ෂක රිචඩ් බට්ලර් එක්සත් ජනපදයේ දෙබිඩි පිලිවෙතට අවධානය යොමු කලේ ය. 2000 සමාලෝචන සම්මේලනයකදී න්‍යෂ්ටික අවි සහිත රාජ්‍යයන් තම අවි තොග ඉවත් කිරීම දිරිමත් කිරීමට පොරොන්දු වී තිබුනු බව සඳහන් කිරීමෙන් පසු ඔහු මෙසේ ලිවී යඃ

''බුෂ් පරිපාලනය ගිවිසුම යටතේ කමත් බැද සිටින වගකීම් හා 2000 අතිරේක පොරොන්දුව පිලිපැදීම ප්‍රතික්ෂේප කර ඇතුවා පමනක් නොව එය දැන් ගිවිසුම යටතේ ජුගුප්සා ජනක වන අලුත් වටයක න්‍යෂටික අවි ගොඩනැගිමේ ද යෙදී සිටියි. ඊනියා ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය සඳහා තමන්ට අවශ්‍ය යයි පරිපාලනය කියන වඩාත් සංයුක්ත, නවතම න්‍යෂ්ටික අවි මේවාය. සිය වගකීම් පැහැරහරින අතරතුර ඉරානය කොටුකර තැබීමේ තම අධිරාජ්‍යය සාර්ථක වේයැයි යන බුෂ් පරිපාලනයේ විශ්වාසය ඇදහිය නොහැක්කකි.''

ඇත්ත වශයෙන් ම එක්සත් ජනපදයේ ක්‍රියා කාලාපය වඩාත් පැහැදිලි හා අශුභ නිගමනයක් වෙත එලඹේඃ බුෂ් පරිපාලනය ''ඉරානය සීමා කර තැබීමට නොව පවතින මොනයම්ම හෝ මාධ්‍යයකින් එය සම්පූර්නයෙන්ම යටත්කර ගැනීමේ අභිලාෂයෙන් ක්‍රියා කරයි. බුෂ් පාරිපාලනය න්‍යෂ්ටික ප්‍රතිපත්තිය ඇමරිකානු භූගෝලීය ආධිපත්‍යය පවත්වාගෙන යාමේ හා ඕනෑම විභව අභියෝගයක් බිඳදැමීමේ හෝ විනාශ කිරීමේ මූලෝපාය සමග මුලුමනින්ම එක පෙලට සිටී. නව පරම්පරාවේ න්‍යෂ්ටික අවි'' එල්ල කරනු ලැබ ඇත්තේ ''ත්‍රස්තවාදීන්'' වෙත නොව ඉරානය වැනි රටවල් විසින් එය ආක්‍රමනය කින් ආරක්ෂාවීම සඳහා පොලොව යට ගොඩනංවා තිබෙන ආරාක්ෂිත බංකර් වෙතය.

ඉරානය පිලිබඳ තමන්ගේ වර්තමාන ආස්ථානය සමග එක පෙලට සිටින පරිදි න්‍යෂ්ටික අවි පරන ගිවිසුමේ මූලික සංශෝධනයක් සඳහා බුෂ් පරිපාලනය දැනටමත් බලපෑම් කරමින් සිටීම පුදුමට කරුනක් නො වේ. *නිව් යෝර්ක් ටයිම්ස්හි* මෑතකදී පලවූ ලිපියක් සඳහන් කලේ බොහෝ රටවල් තමන්ගේ ම න්‍යෂ්ටික

ඉන්ධන නිපදවීමෙන් වැලැක්වීම සඳහා ගිවිසුම සංශෝධනය කල බවයි. මේ මාසයේ ඉරානය පිලිබඳ එක්සත් ජනපදය හා යුරෝපා සංගමය අතර එකඟතාවය නිවේදනය කිරීමට වන්නේ ''සිවිල් න්‍යෂ්ටික වැඩ සටහන්වල ආවතාරය යටතේ බොම්බ සෑදීම සඳහා භාවිතා කල හැකි න්‍යෂ්ටික ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමට රාජ්‍යයන්ට ඉඩලබා දෙන කපොලු වසාලීමට ගිවිසුම වෙනස් කල යුතු යයි බුෂ් ඉල්ලා සිටියේ ය .

ඉරානය සම්බන්ධයෙන් ගත් කල මිලිටරිමය විකල්පය ද ඇතුලත් සියලු විකල්ප පවතින බව බුෂ් පාරිපාලනය නැවත නැවතත් කියා ඇත. ඉරානය සමග වන යුරෝපා සංගමයේ සාකච්ඡාවලට අවසර දීමට ධවල මන්දිරය නාමිකව එකඟත්වය පලකර ඇතත් එය ධවල මන්දිරය ඒක පාර්ශ්වික මිලිටරි ආක්‍රමනයට හෝ ඉරානයට පහරදීම සඳහා ඊස්රායලයේ සිට සංඥා නො කරන බවට සහතිකයක් එක්සත් ජනපද-යුරෝපා සංගම් එකඟතාව නොවේ. නිවේදනය කරනු ලැබූ දින උප ජනාධිපති රිචඩ් චේනි *ෆොක්ස් නිව්ස්* වෙත කීවේ  දිනය අවසන් වනවිට ඉරානීයයන් තමන්ගේ වගකීම් හා ජාත්‍යන්තරයට අනුව න්‍යෂ්ටික වැඩ පිලිවෙල අත් හැරීමට ක්‍රියා නො කරන්නෙම්, නිසැකයෙන් ම දැඩි ක්‍රියාමාර්ගයක් ගැනීමට අපට සිදුවනු  ඇත.

දින කිහිපයකට පසුව බ්‍රිතාන්‍යයේ පලවන *සන්ඩේ ටයිම්ස්* පුවත් පතේ මාර්තු 13 දාතම දරන ලිපියක්, ඊස්රායලය අභ්‍යන්තර කැබිනෙට්ටුව නිගෙව් කන්තාරයේ අගමැති එරියල් ෂැරොන්ගේ ගොවිපලේදී රහසිගතව රැස්වී ඉරාන න්‍යෂ්ටික බලාගාරවලට පහරදීම සඳහා ''මූලික අවසරය'' ලබා දුන් බව ආනාවරනය කලා ය. කොමාන්ඩෝ ඒකක හා බංකර් නාශක බෝම්බවලින් සන්නද්ධ F - 15 ප්‍රහාරක යානා උපයෝගී කරගත් ඊස්රායල හමුදා, නටන්ස් හි ඉරාන යුරේනියම් ප්‍රවර්ධන කම්හලේ ආකෘතියක් ප්‍රහාර පුහුනුවීම සඳහා භාවිතා කොට ඇත.

*සන්ඩේ ටයිම්ස්* පුවත් පතට අනුව ඉරාන න්‍යෂ්ටික ව්‍යාපෘතීන් නැවැත්වීම සඳහා දරනු ලබන සියලුම උත්සායන් ආසාර්ථක වුවහොත් තමන් ඊස්රායලයට හරස් නොකපන බවට සැලසුම් සාකච්ඡා කිරීම සඳහා සහභාගි වු ඇමරිකානු නිලධාරින් ඇඟවුම් කර ඇත. ඉරානය තූල ගුවන් යානා හා කොමාන්ඩෝ යුද ඔත්තු බැලීමේ මෙහෙයුම් ද ඇතුලත්ව ඉරානයට ප්‍රහාරයක් සඳහා පෙන්ටගනයේ සූදානම ගෙනහැර දක්වමින් කෘතහස්ත මාධ්‍යවේදී සේමර් හර්ෂ් විසින් *නිව් යෝකර්* පුවත් පතේ පල කල ලිපියක් එක්සත් ජනපද ප්‍රකාශකයා විසින් සරදමට ලක් කලාක් මෙන් ඊස්රායල නිලධාරීහු ද මෙය ප්‍රතික්ෂේප කොට ඇත.

මැද පෙරදිග කලාපය තූල ආර්ථික හා මුලෝපායික ආධිපත්‍යය පිලිබඳ සිය අභිමතාර්ථය ක්‍රියාවෙහි යෙදවීමට පූර්න පරිමාන ප්‍රහාරයක් ඉරානයට එරෙහිව එල්ල කිරීම ද ඇතුලත්, අවශ්‍ය කරන ඕනෑම මාධ්‍යයක් යොදා ගැනීමට මේ ප්‍රතික්ෂේප කිරීම මධ්‍යයේම බුෂ් පරිපාලනය සූදානම් බවට සැකයක් නැත.

© www.wsws.org